පශ්චාත් සුනාමි වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහනේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2005 දෙසැම්බර් 01 දින එළඹි අංක 664 - එල්කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 (අ) වගන්තිය සහ 2008 අප්‍රේල් 18 දින එළඹි අංක 693 - එල්කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 3.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධානය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වන්නේ, විශේෂයෙන් නිවාස සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය සමාජ හා ආර්ථික යටිතල පහසුකම් සැපයීම, සුනාමිය බලපෑ ප්‍රජාව ශක්තිමත් කිරීම සහ වෙරළ සම්පත් සැලකිය යුතු ලෙස කළමනාකරණය කිරීම සහ සමාජ ආර්ථික කටයුතුවලදී කාන්තා සහභාගීත්වය වැඩි කිරීමයි. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 36.14 ක් වන අතර එයින් රු.මිලියන 3,386.8 කට සමාන එජඩො මිලියන 31.35 ක් හෙවත් සියයට 86.7 ක් මූල්‍යයනය කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, එකඟ වී තිබුණි. වැඩසටහන එහි කටයුතු 2006 මාර්තු 06 දින ආරම්භ කරන ලදී. ණය කාලපරිච්ඡේදය 2014 මාර්තු 31 දින අවසන් වුවද ව්‍යාපෘතියේ කටයුතු 2014 අප්‍රේල් 30 දක්වා පවත්වාගෙන ගිය අතර 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට එම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස

වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහනේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් වැඩසටහන් වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම්, හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්,ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක ශේෂය සහ අවසන් ශේෂය එම ගිණුමෙන් ආපසු ගැනීම හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඒ) ඉකුත් වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2014 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂයන් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

ණය ගිවිසුමේ 05.01 වගන්තියට අනුව මුදල් වර්ෂය පසු වී මාස 03 ක් ඇතුළත වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේය. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 ජනවාරි 26 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යයනය, අයවැය ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමෙහි මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය<br>2014 වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| කෘසජාඅ | 31.35 | 3,386.81 | 27.20 | 26.45 | 31.05 | 3,741.34 |
| ශ්‍රීලංර | 4.37 | 471.96 | 5.00 | 2.30 | 1.46 | 157.19 |
| ප්‍රතිලාභී දායකත්වය | 0.42 | 45.67 | - | - | 0.19 | 20.78 |
| එකතුව | 36.14 | 3,904.44 | 32.20 | 28.75 | 32.70 | 3,919.31 |

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමහර කාර්යයන් සඳහා දරන ලද තත්‍ය පිරිවැය ඒ සඳහා කරන ලද වෙන්කිරීම් වලට වඩා සැළකිය යුතු ලෙස ඉක්මවා තිබුණු අතර එම අතිරික්ත, වැඩසටහනේ වෙනත් කාර්යයන් වලට හිලව් කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එවැනි වෙනස්කිරීම් සඳහා ණය නියෝජිතායතනයේ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එවැනි අතිරික්ත පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සංරචකය | වෙන්කළ අරමුදල් | 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | වෙන්කිරීමට වැඩි අතිරික්තය | අතිරික්තයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | එ.ජ.ඩො. | එ.ජ.ඩො. | |
| සිවිල් වැඩ | 19,647,750 | 22,420,120 | 2,772,370 | 14.11 |
| සේවා සපයන්නන් සමඟ කොන්ත්‍රාත් | 462,300 | 832,081 | 369,781 | 79.98 |
| වැටුප් සහ දීමනා | 1,849,200 | 2,154,516 | 305,316 | 16.51 |

(ආ) කාන්තාවන් සඳහා ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙනුවෙන් ආපසු නොගෙවිය යුතු ආධාර සඳහා ණය අංක 664 එල්.කේ. සහ 693 එල්.කේ යටතේ වෙන්කරන ලද අරමුදල් වලින් වැඩසටහන විසින් උපයෝජනය කර තිබුණේ පිළිවෙලින් එ.ජ.ඩො. 470,548 ක් නියෝජනය වන සියයට 68 සහ එ.ජ.ඩො. 99,481 නියොජනය වන සියයට 5 ක් පමණි.

## 3.2 භෞතික කාර්යසාධනය

-------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ වාර්තාවට අනුව, වැඩසටහනේ සමාජ ආර්ථික යටිතල පහසුකම් සංරචකය යටතේ ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකම් 07 ක භෞතික කාර්යසාධනය වැඩසටහනේ කාල පරිච්ඡේදය අවසාන වන විට සියයට 33 සිට සියයට 84 දක්වා පරාසයක පැවතුණි.

(ආ) වැඩසටහනේ, වෙරළ සම්පත් සැළකිය යුතු ලෙස කළමනාකරණය කිරීමේ සංරචකයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුම් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.